# ජපන් බෞද්ධ මූර්ති ශිල්පීය තාක්ෂණ වේදය තුළ දැකිය හැකි ඉපැරණි ශ්‍රී ලාංකික ආභාසය

ආචාර්ය නිමල් සේනාරත්න[1]


චීනය හා කොරියාව ඔස්සේ ජපානය විසින් හඳුනා ගනු ලැබූ බෝධිසත්ත්ව සංකල්පයට නව අර්ථ කථන සංයෝග කර ගැනීමට ජපන් ප්‍රතිමා හා කලා නිර්මාණ ශිල්පීහු මහත් පරිශ්‍රමයක් දරා ඇත. වර්තමානය වන තෙක් ජපානයේ ආගමික භේදයකින් තොරව ප්‍රබල බලපෑමක් ඇති කර ඇති අවලෝකිතේශ්වර / කන්නොන් බෝධිසත්ත්ව විශ්වාසය හා වැඳුම් පිදුම් ක්‍රම ආශ්‍රිතව බිහි වූ ප්‍රතිමා හා කලා ශිල්පීය ක්ෂේත්‍රය තුළ ජපනීකරණය වූ ශ්‍රී ලාංකික හා විදේශීය බලපෑම් රැසක් හඳුනා ගැනීමට හැකි විය.

ශ්‍රී ලංකාවෙන් හමු වූ මංජු ශ්‍රී භාෂිත චිත්‍ර කර්ම ශාස්ත්‍ර හා වාස්තු විද්‍යා ශාස්ත්‍ර නමැති ප්‍රතිමාකරණ තාක්ෂණවේදී ග්‍රන්ථය එම විෂයයට අයිති ලොව පැරණිතම ග්‍රන්ථය බව විද්වතුන් පිළිගෙන ඇති අතර, එය ශ්‍රී ලාංකික ග්‍රන්ථයක් බව ද දැන් පිළිගෙන අවසානය. එය ක්‍රි. ව. 5 වැනි හා 7 වැනි සියවස් කාලයට අයත් වේ. එම තාක්ෂණවේදී ග්‍රන්ථයේ දක්වා ඇති විධි නියමයන් ජපන් මූර්ති ශිල්පය තුළ දැකිය හැකි වේ.

අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව ප්‍රතිමාවල ජටාමකුටයෙහි ඉදිරිපස අමිතාභ බුදුරුව නිර්මාණය කර තිබීම ජපානයේ හා ශ්‍රී ලංකාවේ අනිවාර්ය ලක්ෂණය විය. එසේම කරුණාවේ හා දයාවේ ස්වභාවය මූර්තිමත් කිරීම මූලික අපේක්ෂාව විය. එසේ වුව ද එකම බෝධිසත්ත්ව සංකල්පය රටවල් දෙකක ද්විත්ව චින්තන දෘෂ්ටියක් නිර්මාණය කර ඇත. ශ්‍රී ලංකික ප්‍රතිමාවල භාරතීය ආභාසය දැකිය හැකි වුවත්, ශ්‍රී ලංකික මූර්ති ශිල්පීන් දේශීය සිද්ධාන්ත හා නියමයන් ද අනුගමනය කර ඇත. ජපන් නිර්මාණ ශිල්පීන් ද චීන, කොරියන් ආභාසය ලබා ගෙන අනතුරුව භාරතීය හා වෙනත් නියමයන් ද අනුගමනය කිරීමට වෙහෙස දරා ඇත. මංජුශ්‍රී භාෂිතය වැනි සංස්කෘත භාෂාවෙන් ලියා ඇති තාක්ෂණවේදී ග්‍රන්ථ සමග තුලනය කරන විට එය හෙළි කර ගත හැකිය.

ජපානයේ දැවමය ප්‍රතිමා සඳහා වෘක්ෂ ඡේදනය කිරීම, ඉචිබොකුත් සුකුරි (Ichiboku tsukuri) ශිල්පීය ක්‍රමය මත ප්‍රතිමා නිර්මාණය හා එම දෙඅංශයම ආශ්‍රිත චාරිත්‍ර විධි, මැටි මිශ්‍රිත දැවමය ප්‍රතිමා ශුලය හෙවත් සැකිල්ල නිර්මාණය කිරීම, ඒ සඳහා වූ මැටි වර්ග තෝරාගැනීම හා මැටි මිශ්‍රණය සාදා ගැනීම, විහාර ප්‍රතිමා ගෘහයේ සංගීතමය පූජා පැවැත්වීම නිර්මාණය කිරීම හා ආරක්ෂක මූර්ති නිර්මාණය කිරීමේ (යක්ෂාලය) ක්‍රමවේද ආශ්‍රිතව මංජුශ්‍රී භාෂිතයේ විධිනියමයන් සන්සන්දනය කළ හැකිය. මංජුශ්‍රී භාෂිතයේ 4 වන අධ්‍යායයේ 08, 09, 15ඉ, 19. 5 වන අධ්‍යායයේ 06, 07, 22, 26. 8 වන අධ්‍යායයේ 01ට, 08. 10 වන අධ්‍යායයේ 06. 11 වන අධ්‍යායයේ 01, 02. 16 වන අධ්‍යායයේ 16, 17, 120, 121. 18 වන අධ්‍යායයේ 51 දැකිය හැකිය.

ශ්‍රී ලංකාවේ හා ජපානයේ කළ ක්ෂේත්‍ර ගවේෂණයේදීත්, දෙරටේම මූලාශ්‍රය පරිශීලනය කිරීමේදීත්, අදාළ ක්ෂේත්‍රයේ විද්වතුන් සමග හා ජපානයේ සාම්ප්‍රදායික ශිල්පීන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේදීත් සොයා ගත් දත්ත තුලනාත්මකව විශ්ලේෂණය කර සම්පිණ්ඩනය කිරීමේදී පැහැදිලි වන්නේ ජපාන මූර්ති ශිල්පීය තාක්‍ෂණික ක්‍රම වේදය තුළ හා චාරිත්‍රවිධීන් තුළ ශ්‍රී ලාංකික ආභාසයක් දැකිය හැකි බවයි.


**ප්‍රමුඛ පද:** ජපානය, මූර්ති ශිල්පය, තාක්‍ෂණවේදය

1 BA. (Hons.), Ph.D.
nimal.sena@gmail.com